 0476

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය I
கிறிஸ்தவ நாகரிகம் I
Christian Civilization I

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ✻ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✻ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✻ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

**1.** මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගාව පිහිණිය හරහා ගලා බසියි.
(2) මෙසපොතේමියාව බැබිලෝනිය ලෙස ද හඳුන්වනු ලැබී ය.
(3) දමස්කය මෙසපොතේමියාවේ පිහිටි නගරයක් විය.
(4) මෙසපොතේමියානුවන් ඒකදේවවාදීහු වූහ.
(5) ඉපැරණි මෙසපොතේමියාවේ ප්‍රධාන ආර්ථික මාර්ගය වෙළඳාම විය.

**2.** සෙලොට්වරුන්ගේ ප්‍රධාන සතුරන් වූයේ
(1) සමරිතානුවරු ය. (2) පරිසිවරු ය. (3) ලේකම්වරු ය.
(4) එසීනවරු ය. (5) රෝමවරු ය.

**3.** පහත සඳහන් යුගල් අතුරෙන් නිවැරදි යුගලය කුමක් ද?
(1) පැට්‍රීසියන් සහ ප්ලේබියන් - රෝම සමාජයේ ප්‍රධාන කොටස් දෙක
(2) රෝම ගොඩනැගිලි කලාව - නෝත්‍රඩැම් ආසන දෙව්මැදුර
(3) ත්‍රිකෝණාකාර (පිරමීඩාකාර) ධූරාවලිය - සහභාගිත්වයේ ව්‍යුහය
(4) දෙවිවරු, රජවරු සහ වීරවරු - සභාවේ පරිපාලක සැකැස්ම
(5) බැසිලිකා දෙව්මැදුරු - බැබිලෝනියාන සංස්කෘතික මධ්‍යස්ථානය

**4.** මහා හෙරෝද් රජුගේ ඇවෑමෙන් අනතුරුව ජුදයාව පාලනය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) පිලිප් (2) හෙරෝද් ඇන්ටිපස් (3) ෆීලික්ස්
(4) අර්කෙලාවුස් (5) සදොක්

**5.** ජෙරුසලම පිහිටා ඇත්තේ
(1) ගලීලයෙහි ය. (2) බාෂාන්හි ය. (3) ගිලියද්හි ය.
(4) ඒදෝම්හි ය. (5) ජුදයාවෙහි ය.

**6.** ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ දී වහලුන්ව සිටියේ කවර රජ සමයේ දී ද?
(1) දෙවන රාමසෙස් (2) හතරවන අමෙන් හොටෙබ් (ආමන් ගොටබු)
(3) තුන්වන තුත්මෝස (දොද්මාෂ්) (4) මෙර්නෙප්තා
(5) හතරවන එපිපානෙස්

**7.** අපර-විප්‍රවාසී සමයේ ජුදා දේශයේ පාලනයේ නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.
(1) පර්සියානු, ග්‍රීක සහ රෝම (2) ග්‍රීක, සිරියානු සහ අසිරියානු
(3) පර්සියානු, රෝම සහ ග්‍රීක (4) ග්‍රීක, රෝම සහ සිරියානු
(5) ඊජිප්තු, ග්‍රීක සහ රෝම

**8.** ඊශ්‍රායෙලය උතුරු සහ දකුණු රාජ්‍යයන් ලෙස දෙකඩ වූයේ මින් කවර රජ සමයේ දී ද?
(1) සලමොන් (2) රෙහොබෝවාම් (3) ජොෂියා
(4) මනස්සේ (5) ශෙදකියා

[දෙවැනි පිටුව බලන්න

**9.** බැබිලෝනියානු විප්‍රවාසයෙන් අනතුරුව ජෙරුසලමට නැවත පැමිණි ජුදා නීති විශාරදයා කවුද?
(1) එස්රා ය. (2) නෙහෙමියා ය. (3) ජෝෂුවා ය.
(4) සෙරුබ්බාබෙල් ය. (5) එසකියෙල් ය.

**10.** පහත ප්‍රකාශ සලකන්න.
A – පිරමීඩ සොහොන්ගැබ් ලෙස භාවිත කරන ලදී.
B – ඊජිප්තුව සංස්කෘතික තොටිල්ල ලෙස හඳුන්වන ලදී.
C – ඊජිප්තු ජාතිකයන් මරණින් මතු ජීවිතයක් ගැන විශ්වාස කළහ.
D – ඊජිප්තු ජාතිකයෝ ලිවීමට පැපිරස් භාවිත කළහ.
E – ආබ්‍රහම්ගේ පුත්‍රයා වූ ඊසාක් ඊජිප්තුවේ පරිපාලකයෙක් (යුවරජ) ලෙස කටයුතු කළේ ය.
මේ අතුරින් ඊජිප්තුව පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය.
(4) B, C සහ D ය. (5) C, D සහ E ය.

**11.** දාවිත් රජ සිය රජ සමයේ ප්‍රථම වසර හතෙහි ජීවත් වූයේ,
(1) හේබ්‍රොන්හි ය. (2) ජෙරුසලමෙහි ය. (3) බෙයර්ෂෙබාහි ය.
(4) ශෙකෙම්හි ය. (5) බෙතෙල්හි ය.

**12.** පහත ප්‍රකාශ සලකන්න.
A – රෝමවරුන්ගේ භාෂාව වූයේ ලතින් භාෂාවයි.
B – ග්‍රීකවරුන්ට පෙර පලස්තීනය පාලනය කරන ලද්දේ රෝමවරුන් විසිනි.
C – රෝම අධිරාජ්‍ය සමයේ දී යුරෝපය පුරා ආගමික සහ දේශපාලන සහජීවනයක් පැවතුණි.
D – ඉපැරණි රෝමවරු ඒකදේවවාදීහු වූහ.
E – බැසිලිකා, රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අයත් වූවකි.
මේ අතුරෙන් රෝම ශිෂ්ටාචාරය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ E ය.
(4) B, C සහ D ය. (5) B, D සහ E ය.

**13.** 'සුක්කොත්' යනුවෙන් හඳුන්වනු ලැබූයේ
(1) නුමුහුන් පූප මංගල්‍යය ය. (2) පාස්කු මංගල්‍යය ය.
(3) කූඩාරම් මංගල්‍යය ය. (4) පෙන්තකොස්ත මංගල්‍යය ය.
(5) දේවමාලිගාව කැපකිරීමේ මංගල්‍යය ය.

**14.** පහත කරුණු සලකන්න.
A – අන්‍යදේව වන්දනාව
B – දේශයේ ආරක්ෂාව සඳහා රජෙකුගේ සහ ස්ථාවර හමුදාවක අවශ්‍යතාව
C – අසල්වැසි රටවල් රජවරුන් විසින් පාලනය කරනු ලැබීම
D – සාමුවෙල්ගේ බලපෑම
E – සාමුවෙල්ගේ පුතුන් හරියාකාරව ක්‍රියා නොකිරීම
මේ අතුරෙන් පැරණි ඊශ්‍රායෙල් රාජ්‍ය තන්ත්‍රයේ ආරම්භය පිළිබඳ නිවැරදි කරුණු වනුයේ
(1) A, B සහ C ය. (2) A, C සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**15.** යුරෝපයේ ප්‍රථම විශ්ව විද්‍යාලය වූයේ,
(1) පැරිස් විශ්වවිද්‍යාලය ය. (2) ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය ය.
(3) කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ය. (4) බොලොඤ්ඤා විශ්වවිද්‍යාලය ය.
(5) සලමන්කා විශ්වවිද්‍යාලය ය.

**16.** සබත ආරම්භ වූයේ
(1) සිකුරාදා සවස තරු තුනක් අහසේ දිස් වූ පසුව ය.
(2) සිකුරාදා සවස සඳ අහසේ දිස් වූ පසුව ය.
(3) සෙනසුරාදා උදෑසන හිරු නැගීමත් සමග ය.
(4) සෙනසුරාදා මධ්‍යම දොළහට ය.
(5) සෙනසුරාදා සවස හිරු බැසයාමත් සමග ය.

**17.** ජේසුතුමා මින් කවර අයබදු අයකරන්නන්ගේ ගෘහවල ආහාර අනුභව කරන ලද්දේ ද?
(1) සකේවුස් සහ ලාසරස් (2) ලාසරස් සහ ලෙවී (3) සකේවුස් සහ ලෙවී
(4) සීමොන් සහ ලෙවී (5) සකේවුස් සහ සීමොන්

**18.** "ඔබේ අදහස එසේ ය කීම නම් 'එසේ ය' කියා ද නැත කීම නම් 'නැත' කියා ද වේවා" යන්න ජේසුතුමා පවසන ලද්දේ එතුමා මින් කුමන කරුණ උගන්වන ලද අවස්ථාවේ දී ද?
(1) සතුරන්ට ප්‍රේම කිරීම (2) පළිගැනීම (3) දන් දීම
(4) දිවුරුම් දීම (5) යැදුම

**19.** ශුභාරංචිවලට අනුව ජේසුස් වහන්සේ විසින් සුවය දානය කරනු ලැබීමට අත්‍යවශ්‍ය වූයේ
(1) ප්‍රේමයයි. (2) බලාපොරොත්තුවයි. (3) ඇදහිල්ලයි.
(4) කීකරුකමයි. (5) යාච්ඤාවයි.

**20.** ජේසුස්වහන්සේගේ ඇලයට හෙල්ලයකින් ඇණීමෙන් පසු පිටවූ ජලය සංකේතවත් කරන ලද්දේ කුමක් ද?
(1) ජීවිතය (2) නිදහස (3) සාමය
(4) සාධාරණත්වය (5) ශුද්ධාත්මයාණන් තුළ ජීවිතය

**21.** උත්ථානයෙන් පසු ජේසුස් වහන්සේ ප්‍රථමවරට පිරිමි ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථාවේ දී මුලින් ම පවසන ලද්දේ මින් කුමක් ද?
(1) ජීවත්ව සිටින්නන් මළවුන් අතර නොසොයන්න.
(2) මා ස්පර්ශ නොකරන්න.
(3) ඔබ මා දුටු නිසා අදහාගන්නාහු ය.
(4) ඔබට සාමය වේවා.
(5) ගලීලයට යන්න.

**22.** මුල් සභාව මුහුණ දුන් ප්‍රථම ගැටලුව වූයේ
(1) පේදුරුතුමා සහ පාවුලුතුමා අතර චර්මඡේදනය පිළිබඳ නොඑකඟතාවයි.
(2) පේදුරුතුමා සහ ජාකොබ්තුමා අතර චර්මඡේදනය පිළිබඳ නොඑකඟතාවයි.
(3) පාවුලුතුමා සහ ජාකොබ්තුමා අතර චර්මඡේදනය පිළිබඳ නොඑකඟතාවයි.
(4) හෙබ්‍රෙව් භාෂාව කතා කරන ලද ජුදාවරුන් ඔවුන්ගේ වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳ පැමිණිල්ලයි.
(5) ග්‍රීක් භාෂාව කතා කරන ලද ජුදාවරුන් ඔවුන්ගේ වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳ පැමිණිල්ලයි.

**23.** සභාව ආරම්භ වූයේ
(1) ජේසුතුමා බෞතිස්මය ලැබූ දින ය. (2) මහා සිකුරාදා ය. (3) පාස්කු ඉරිදා ය.
(4) පෙන්තකෝස්ත මංගල දින ය. (5) අහස් නැගී මංගල දින ය.

**24.** පහත ප්‍රකාශ සලකන්න.
A – ජෙරුසලමේ උපත ලැබීය
B – රෝමානු පුරවැසියෙකි
C – පරිසිවරයෙකු සහ රබ්බිවරයෙකි
D – ග්‍රීක භාෂාව කතාකරන්නෙකි
E – අන්තියෝකියේ දී ප්‍රාණ පරිත්‍යාගී විය
මේ අතුරෙන් ශු. පාවුලුතුමා පිළිබඳ සත්‍ය ප්‍රකාශ වනුයේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) B, D සහ E ය.

**25.** ශුද්ධ වූ පාවුලුතුමන් මව්කුසයේ සිටියදී ම දෙවියන්ගෙන් කැඳවීම ලැබුයේ මින් කවර දිවැසිවරුන් මෙන් ද?
(1) ආමොස් සහ හොසියා (2) හොසියා සහ එසකියෙල් (3) ආමොස් සහ දානියෙල්
(4) යෙසායා සහ ජෝවෙල් (5) යෙසායා සහ ජෙරමියා

**26.** පහත ප්‍රකාශ සලකන්න.
A – ජුදා මන්ත්‍රණ සභාව පරිසිවරුන්ගෙන් සමන්විත විය.
B – ජුදා ජනතාව මෙසියස්තුමන් තුළ බලවත් රජෙකු බලාපොරොත්තු වූහ.
C – පීඩනය හේතුවෙන් ජෙරුසලමින් පලා ගිය කිතුනුවෝ තමන් ගිය තැන්වල ශුභාරංචිය දේශනා කළහ.
D – පීඩනය නිසා ජෙරුසලමෙන් පිටවූ පිරිසට ශුද්ධ වූ ස්තේපන්තුමා ද ඇතුළත් විය.
E – ක්‍රිස්තියානිවරුන් රෝම අධිරාජ්‍යයට සහ සංස්කෘතියට විරුද්ධ සමූහයක් ලෙස සලකන ලදී.
මේ අතුරෙන් මුල් ක්‍රිස්තියානි සභාව පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**27.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ග්‍රීක භාෂාව රෝම අධිරාජ්‍යයේ නිල භාෂාව විය.
(2) ඇලෙක්සැන්ඩර් අධිරාජයා විසින් අල්ලාගත් රටවල ග්‍රීක සංස්කෘතිය ප්‍රචලිත විය.
(3) කිතුදහම වැළඳගත් ජනතාව අතර රෝම ප්‍රභූ ජනතාව ප්‍රධාන කණ්ඩායම විය.
(4) ශුද්ධ වූ පේදුරුතුමා සහ ශුද්ධ වූ පාවුලුතුමා ප්‍රාණපරිත්‍යාගී වූයේ දියොක්ලේසියානු අධිරාජ්‍ය සමයේ දී ය.
(5) ශුද්ධ වූ පාවුලුතුමන් ජුදා ගෝත්‍රයට අයත් විය.

**28.** පහත ප්‍රකාශ සලකන්න.
A – මිලාන් ආඥාව ප්‍රකාශයට පත්වූයේ ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍ය සමයේ දී ය.
B – මිලාන් ආඥාවත් සමග කිතුනුවන්ට පීඩාකිරීම මුළුමනින් නතර විය.
C – ග්‍රීකවරුන්ගේ බලපෑම මත මිලාන් ආඥාව ප්‍රකාශයට පත් කරන ලදී.
D – කිතුනුවන්ගෙන් බලයෙන් ලබා ගත් ධනය නැවත ආපසු දෙන ලදී.
E – මිලාන් ආඥාවත් සමග කුරුසපත් කිරීම තහනම් කරන ලදී.
මේ අතුරෙන් මිලාන් ආඥාවට අදාලව නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, C සහ E (5) B, D සහ E

- පහත සඳහන් වගුව භාවිත කර **29** සිට **30** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| A - ඒරියන්වාදය | B - නෙස්ටෝරියන්වාදය | C - පෙරදිග පැවිදි නීතිය | D - ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලය | E - අන්තියෝකියානු ගුරුකුලය |
| F - ශු. ජෙරුසලමේ සිරිල්තුමා | G - ශු. මහා බැසිල්තුමා | H - නිසියානු මන්ත්‍රණ සභාව | I - එපීස මන්ත්‍රණ සභාව | J - ශු. ක්ලෙමන්ට්තුමා |

**29.** 'මරියාවන් දේව මාතාව' යන ඉගැන්වීමට සම්බන්ධ යුගලය වනුයේ
(1) A සහ G ය. (2) A සහ H ය. (3) B සහ I ය. (4) C සහ J ය. (5) D සහ H ය.

**30.** පැවිදිවරුන්ගේ විනය සම්බන්ධ යුගලය වනුයේ
(1) A සහ I ය. (2) B සහ H ය. (3) B සහ J ය. (4) C සහ G ය. (5) C සහ F ය.

**31.** පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශු. පැට්‍රික්තුමා අයර්ලන්තයේ ධර්මදූතවරයා ලෙස හඳුන්වනු ලබයි.
(2) ශු. බොනිෆස්තුමා එංගලන්තයේ ක්‍රිස්තියානිය පැතිරවීය.
(3) කැන්ටබරියේ ශු. අගෝස්තීනුතුමා බ්‍රිතාන්‍ය ජාතිකයෙකු විය.
(4) ශු. බැසිල්තුමා බෙනදික්තානු නිකායික තාපසවරයෙකු විය.
(5) ශු. කොලොම්බන්තුමා එංගලන්තයේ ධර්මදූතවරයා ලෙස හඳුන්වනු ලබයි.

**32.** පහත ප්‍රකාශ සලකන්න.
A – ශු. බෙනඩික්ට්තුමා පෙරදිග තාපසවරයේ නිර්මාතෘවරයා ය.
B – බෙනදික්තාන තාපස නිකාය දහතුන්වන සියවසේ දී ආරම්භ කරන ලදී.
C – බෙනදික්තාන නිකායේ ආදර්ශ පාඨය යාච්ඤාව සහ වැඩ කිරීමයි.
D – ගෝත්‍රික ජනතාව කිතුදහමට ගෙන ඒමට බෙනදික්තාන නිකාය මහත් දායකත්වයක් ලබා දෙන ලදී.
E – බෙනදික්තාන තාපස නිකාය අධ්‍යාපනය සඳහා සුවිශේෂ දායකත්වයක් ලබා දෙන ලදී.
මේ අතුරෙන් බෙනදික්තාන තාපස නිකාය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වනුයේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, C සහ E ය. (5) C, D සහ E ය.

**33.** තාපස ජීවිතයේ ප්‍රධාන ලක්ෂණ ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
(1) නිශ්ශබ්දතාව, වැඩකිරීම සහ අධ්‍යාපනය
(2) නිශ්ශබ්දතාව, යාච්ඤා කිරීම සහ උපවාසය
(3) මර්දන ක්‍රියා, අධ්‍යාපනය සහ යාච්ඤා කිරීම
(4) ව්‍රතශුද්ධිය, වැඩකිරීම සහ අධ්‍යාපනය
(5) ව්‍රතශුද්ධිය, උපවාසය සහ දේශනාකිරීම

[පස්වැනි පිටුව බලන්න

**34.** නවවන සියවසේ සිට එකොළොස්වන සියවස දක්වා කාලපරිච්ඡේදය සභාවේ 'අඳුරු යුගය' ලෙස හඳුන්වනු ලැබීමට තුඩුදුන් ප්‍රධාන හේතු වනුයේ,

(1) කුරුස යුද්ධ ඇතිවීම, සභාවේ බලය පිරිහීම සහ ධර්මදූතවරුන්ගේ හිඟයයි.
(2) පෙරදිග සහ අපරදිග සභා අතර ගැටුම් ඇතිවීම, කුරුස යුද්ධ හා සභා නායකයන් ලෞකිකත්වයට බරවීමයි.
(3) රාජ්‍යය සහ සභාව අතර බල අරගලය, ධර්මදූතවරුන්ගේ හිඟය සහ සභා නායකයන්ගේ බලලෝභීත්වයයි.
(4) පෙරදිග අපරදිග සභා අතර ගැටුම් ඇතිවීම, යුරෝපය පුරා වසංගත පැතිරීම සහ සභා පාලනය දුර්වලවීමයි.
(5) කුරුස යුද්ධ, යුරෝපය පුරා වසංගත රෝග පැතිරීම සහ පැවිදි පිරිස් නූගත් අය වීමයි.

**35.** පහත ප්‍රකාශ සලකන්න.

A – පෙරදිග සහ අපරදිග සභා වෙන්වීම නිසා බටහිර සභාවට නිදහසේ වර්ධනයවීමට හැකි විය.
B – කොන්ස්තන්තිනෝපලයේ පත්‍රියාක්තුමා සහ රෝමයේ පාප්තුමා සම තත්ව හොබවන බව පෙරදිග සභාව සලකන ලදී.
C – ශුද්ධාත්මයාණෝ පියාණන්ගෙන් පමණක් නික්මෙන බව බටහිර සභාවේ අදහස විය.
D – පෙරදිග සහ අපරදිග සභා වෙන් වූ අවධියේ මයිකල් සෙලාරියුස් පෙරදිග සභාවේ පත්‍රියාක්වරයා විය.
E – පෙරදිග සහ බටහිර සභා වෙන්වීමත් සමග විවිධ ජනවන්දනා පිළිවෙත් ගොඩනැගුණි.

මේ අතුරෙන් 1054 දී පෙරදිග සහ අපරදිග සභා වෙන්වීම පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) B, C සහ D ය.
(4) B, D සහ E ය. (5) C, D සහ E ය.

**36.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 15 වැනි ශතවර්ෂයේ දී යාචක නිකායයන් බිහිවිය.
(2) සිස්ටර්ෂියන් නිකාය ප්‍රධාන යාචක තාපස නිකායකි.
(3) යාචක නිකායයන් බිහිවීමට ප්‍රධාන හේතුව වූයේ සභාව ලෞකිකත්වයට පත්වීමයි.
(4) ප්‍රැන්සිස්කාන නිකාය දකුණු ප්‍රංශයේ බිහිවූවකි.
(5) නිශ්ශබ්දතාව සහ ධ්‍යානය යාචක නිකායයන්හි ප්‍රධාන ලක්ෂණ වේ.

**37.** පහත සඳහන් යුගල අතුරෙන් නිවැරදි යුගලය තෝරන්න.

(1) ජෝන් වෙස්ලි - මෙතෝදිස්තවාදයේ නිර්මාතෘ
(2) අටවැනි හෙන්රි රජ - නොයන්හි උපත
(3) විට්න්බර්ග් විශ්වවිද්‍යාලය - ජිනීවා
(4) මාටින් ලූතර් - දොමිනිකාන තාපසවරයෙකි
(5) ජෝන් කැල්වින් - ඇංග්ලිකන්වාදයේ නිර්මාතෘ

**38.** ශු. කොලොම්බාතුමා අධ්‍යාපනය නංවාලීමට සේවයේ යෙදුණු රටවල් වන්නේ

(1) ජර්මනිය, අයර්ලන්තය සහ එංගලන්තයයි.
(2) අයර්ලන්තය, එංගලන්තය සහ ස්කොට්ලන්තයයි.
(3) එංගලන්තය, ප්‍රංශය සහ ඩෙන්මාර්කයයි.
(4) අයර්ලන්තය, ප්‍රංශය සහ ස්කොට්ලන්තයයි.
(5) ස්වීඩනය, ප්‍රංශය සහ ඩෙන්මාර්කයයි.

**39.** 'පීකිං' මානවයාගේ හිස්කබල සොයාගැනීමෙහිලා සම්බන්ධ වූ ක්‍රිස්තියානි විද්‍යාඥයා වූයේ

(1) තෙයියාඩ් ද ෂාර්ඩෑන් ය. (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් ය. (3) අයිසැක් නිව්ටන් ය.
(4) ඇල්බට් අයින්ස්ටයින් ය. (5) ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින් ය.

**40.** පහත ප්‍රකාශ සලකන්න.

A – ලතින් සභා පියවරයෙක් සහ සභා දේවධර්මාචාර්යවරයෙකු විය
B – ක්‍රිස්තියානි පාසල්වල සහ ප්‍රාඥයන්ගේ අනුග්‍රාහකයා (සංරක්ෂකයා) විය
C – කාර්තේජ් විශ්වවිද්‍යාලයේ නීතිය හදාරන ලදී
D – VI උර්බානු පාප්තුමාගේ උපදේශක ලෙස සේවය කළේ ය
E – ක්‍රිස්තියානි ඉගැන්වීම් ප්ලේටෝ චින්තනය ඇසුරෙන් පැහැදිලි කරන ලදී

මේ අතුරෙන් හිපෝහි ශු. අගෝස්තීනුතුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ

(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, B සහ E ය.
(4) A, C සහ E ය. (5) B, C සහ E ය.

**41.** සෙලානෝ තෝමස් විසින් රචිත නවකතාවක් වන්නේ
(1) පපුවේ පළිහ (Breast Plate) ය.
(2) වන්දනාකරුවන්ගේ ගමන (The Pilgrims' Progress) ය.
(3) අහිමිකරගත් සුගති උද්‍යානය (Paradise Lost) ය.
(4) නැවත ලබාගන්නා සුගති උද්‍යානය (Paradise Regained) ය.
(5) කෝපයේ දිනය (Dies Irae) ය.

**42.** ලතින් සභාවේ ප්‍රමුඛස්ථානයක් ගන්නා ආගමික අභ්‍යාස මොනවාද?
(1) දිව්‍ය පූජාව, සාන්තුවර බැතිය සහ ජලයේ ගිල්වා බෞතිස්ම කිරීම
(2) දිව්‍ය පූජාව, සාන්තුවර බැතිය සහ වන්දනා ගමන්
(3) බයිබලය (දේව වචනය) බෙදා ගැනීම, වන්දනාගමන් සහ යැදුම් එකතු
(4) දිව්‍ය පූජාව, උපවාසය සහ වන්දනා ගමන්
(5) දිව්‍ය පූජාව, උපවාසය සහ සාන්තුවර බැතිය

**43.** ජර්මානු ලූතරානු සභාව ඉන්දියාවට හඳුන්වාදුන්නේ කිනම් වර්ෂයේ ද?
(1) 1552 (2) 1653 (3) 1706 (4) 1836 (5) 1912

**44.** ශ්‍රී ලංකාවේ 'ලන්දේසි පාසල්' යන පාසල් වර්ගය පිහිටුවන ලද නගර ඇතුළත් වරණය මින් කුමක් ද?
(1) කොළඹ, ත්‍රිකුණාමලය, යාපනය සහ මාතර
(2) කොළඹ, ගාල්ල, මාතර සහ යාපනය
(3) කොළඹ, යාපනය, මහනුවර සහ මඩකලපුව
(4) කොළඹ, ගාල්ල, මාතර සහ හලාවත
(5) කොළඹ, කළුතර, යාපනය සහ මහනුවර

**45.** ශ්‍රී ලාංකේය කතෝලිකයන්ට ආගමික නිදහස ප්‍රකාශයට පත්කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වනුයේ
(1) තෝමස් මේට්ලන්ඩ් ය. (2) ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය.
(3) ජෝර්ජ් විලියම් ඇන්ඩර්සන් ය. (4) රොබට් බ්‍රවුන්රිග් ය.
(5) එඩ්වඩ් බාන්ස් ය.

**46.** පහත ප්‍රකාශ සලකන්න.
A – හින්දු දෙමාපියන්ට දාව උපත ලදී
B – 'පාදුකාවලන්' යන සතිපතා පුවත්පත ආරම්භ කළේ ය
C – දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළේ ය
D – නිර්මල මරිය නිකායට බැඳුණි
E – ප්‍රථම දේශීය රදගුරුතුමා ලෙස අභිෂේක කරන ලදී

මේ අතුරෙන් ස්වාමි ඥානප්‍රකාශර් පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය.
(4) B, C සහ D ය. (5) B, C සහ E ය.

● අංක **47** සහ **48** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත වගුව යොදාගන්න.

| | | | |
|---|---|---|---|
| A - රේරුම් නොවාරුම් (Rerum Novarum) | B - ක්වඩ්රාජෙසිමෝ අන්නෝ (Quadragesimo Anno) | C - ලෝක සභා සමුළුවේ ප්‍රථම රැස්වීම | D - ප්‍රථම ලෝක මිෂනාරි සමුළුව |
| E - ඇම්ස්ටර්ඩෑම්, නෙදර්ලන්තය | F - XIII ලියෝ පාප්තුමා | G - එඩින්බර්ග්, එංගලන්තය | H - XI පියුස් පාප්තුමා |

**47.** ප්‍රථම සමාජ විශ්වලේඛනය හා සම්බන්ධ යුගලය වනුයේ
(1) A සහ E ය. (2) A සහ F ය. (3) B සහ G ය. (4) B සහ H ය. (5) C සහ H ය.

**48.** 1948 දී සභා 147 කින් සමන්විතව පැවැත් වූ සාමයික සමුළුව හා සම්බන්ධ යුගලය වන්නේ
(1) A සහ E ය. (2) A සහ F ය. (3) B සහ E ය. (4) B සහ G ය. (5) C සහ E ය.

**49.** ආසියානු රදගුරු සම්මේලනයේ ආරම්භයට තුඩුදුන් ආසියාතික රදගුරු රැස්වීම පැවැත්වූයේ

(1) දෙවන වතිකානු කතිකාවත අවස්ථාවේ දී රෝමයේ දී ය.
(2) VI පාවුලු පාප්තුමා සමග 1970 දී මැනිලාහි දී ය.
(3) 1971 දී රෝමයේ රදගුරු සමුළුව අවස්ථාවේ දී ය.
(4) 1971 දී හොංකොං හි දී ය.
(5) 1979 දී II ජුවාම් පාවුලු පාප්තුමා සමග රෝමයේ දී ය.

**50.** ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ප්‍රථම රැස්වීම පැවැත්වූයේ

(1) සිංගප්පූරුවේ දී ය.
(2) ඉන්දුනීසියාවේ දී ය.
(3) ජපානයේ දී ය.
(4) ඉන්දියාවේ දී ය.
(5) මැලේසියාවේ දී ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ශිෂ්ටාචාරයේ සම්භවය (ඇරඹුම) පිළිබඳ කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) ඊජිප්තු ශිෂ්ටාචාරයේ (නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයේ) ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ලතින් භාෂාව සමාජ සංවර්ධනයට දායක වූ අන්දම විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ශිෂ්ටාචාරය සහ සංස්කෘතිය අතර සමානාත්මතා සහ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**2.** (i) ඊශ්‍රායෙලයේ විනිශ්චයකරුවන් **සිව්දෙනෙකු** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) අපර-විප්‍රවාසී යුගයේ ජුදා නවෝදය (පුනරුදය) පිළිබඳ කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) ජේසුස් වහන්සේ ජීවත් වූ සමයේ සමරිතානුවරුන්ගේ ජීවිත ක්‍රමය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) කෝපය, පළිගැනීම, සතුරන්ට ප්‍රේම කිරීම සහ උපවාසය පිළිබඳව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

**3.** (i) පුනරුද සමයේ චිත්‍රශිල්පීන් **සිව්දෙනෙකු** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) වර්ණ වීදුරු කලාව පිළිබඳ කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) චීන දේශයේ ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය සමයේ ක්‍රිස්තියානි කලා සහ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 08යි)

## II කොටස

**4.** (i) ජුදා සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ශ්‍රී ලාංකේය සංස්කෘතිය කෙරෙහි ක්‍රිස්තියානි සංස්කෘතියේ දායකත්වය සහ ක්‍රිස්තියානි සංස්කෘතිය මත ශ්‍රී ලාංකේය සංස්කෘතියේ බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**5.** (i) ජේසුස් වහන්සේගේ දුක්විඳීම සහ මරණය පිළිබඳ සම්මත ශුභාරංචි හතරෙහි සඳහන් මූලික තොරතුරු ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) සාධාරණත්වය සහ සාමය අරභයා අරගලයක යෙදී සිටින ජනතාවට ජේසුස් වහන්සේගේ දුක්විඳීම සහ මරණය අදාලවන අන්දම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**6.** (i) යුරෝපීය ගෝත්‍රවල ශිෂ්ටාචාරයට බෙනදිකාන නිකායිකයන්ගේ දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) "දේශය ගොඩනැංවීමේලා ආගමික අධ්‍යාපනයේ භූමිකාව (කාර්යභාරය)" යන මැයින් රචනයක් ලියන්න. (ලකුණු 10යි)

**7.** (i) බටහිර සභාව (Western Church) ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ තෝමස් මුන්ස්ටර්තුමා දැරූ ප්‍රධාන අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) නූතන ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ සභා නවෝදයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

**8.** (i) පරිසරය සුරැකීම පිළිබඳ ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ (Asian Christian Council) ඉගැන්වීම් ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) "පරිසරය සුරැකීම සැමගේ යුතුකමකි." ඔබ වටපිටාවේ පරිසරය සුරැකීම අරබයා ඔබට දායක විය හැකි අන්දම පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයය කොටස් දෙකකින් සමන්විත වේ. ඉන් I පත්‍රය බහුවරණ ප්‍රශ්න 50කින් සමන්විත වෙයි. II වන පත්‍රය කොටස් දෙකකින් සමන්විත වන අතර පළමු කොටසට ප්‍රශ්න 3ක්ද, දෙවන කොටසට ප්‍රශ්න 5ක්ද ඇතුලත් වෙයි.

I පත්‍රයේ බහුවරණ ප්‍රශ්න 50ටම පිළිතුරු සැපයීම අපේක්ෂා කරයි. එම ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී මුළු විෂය නිර්දේශයම ඇතුළත් වන සේ ප්‍රශ්න සකසා ඇති අතර එමගින් ශිෂ්‍යයා තුළ විෂයය පිළිබඳ ඇති පරිපූර්ණ දැනුම පරීක්ෂා කරයි. II වන පත්‍රයේ පළමු කොටසේ ප්‍රශ්න තුනෙන්, දෙකකට පිළිතුරු ලිවිය යුතු අතර, II වන කොටසේ ප්‍රශ්න පහෙන් ප්‍රශ්න තුනකට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ. මෙම දෙවන පත්‍රයේ පළමු කොටසේ ප්‍රශ්නයකට කොටස් හතරක් ඇතුලත් වෙයි. ඉන් පළමු කොටස් දෙකකට අසා ඇති කරුණු පමණක් ලිවිය යුතු අතර 3,4 කොටස් දෙකට කෙටි විස්තරයක් ලිවීම අපේක්ෂා කෙරෙයි. ලැබෙන ලකුණු ප්‍රමාණයද ක්‍රමානුකූලව වැඩි වර්ධනය වන ආකාරයට ප්‍රශ්න සකසා ඇත. II වන පත්‍රයේ II කොටසේ ප්‍රශ්නයකට කොටස් දෙකක් ඇතුළත් වෙයි. කොටස්වලට ලැබෙන ලකුණු ප්‍රමාණයද සමසේ බෙදී යයි. ප්‍රශ්නයේ පළමු කොටසින් අසා ඇති ප්‍රශ්නයේ අන්තර්ගතය පිළිබඳව විෂයය දැනුම පරීක්ෂා කෙරෙන අතර දෙවන කොටසෙන් අසා ඇති ප්‍රශ්නයට අනුව ශිෂ්‍යයාගේ ප්‍රායෝගික දැනුම විමර්ශනය කරයි.

# ලකුණු ගණනය කිරීම

## I පත්‍රය - බහුවරණ ප්‍රශ්න

එක ප්‍රශ්නයකට ලකුණු - 01

ප්‍රශ්න 50ට ලකුණු - 50 X 1 = 50

## II පත්‍රය

### I කොටස

ලකුණු බෙදී යන ආකාරය

| | |
|---|---|
| I කොටස | 2 |
| II කොටස | 4 |
| III කොටස | 6 |
| IV කොටස | 8 |
| | 20 |

ප්‍රශ්න 2ට ලකුණු 2 X 20 = 40

### II කොටස

ලකුණු බෙදී යන ආකාරය

| | |
|---|---|
| I කොටස | 10 |
| II කොටස | 10 |
| | 20 |

ප්‍රශ්න 3ට ලකුණු 3 X 20 = 60

## II පත්‍රය

මුළු ලකුණු 5 X 20 = 100

## අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය 50 X 1 = 50

II පත්‍රය 5 X 20 = 100

**අවසාන ලකුණු** $50 + \left(\frac{100}{2}\right)$

$= \underline{100}$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................
........................................................ √ △ 4/5
........................................................

(ii) ........................................................
........................................................ √ △ 3/5
........................................................

(iii) ........................................................
........................................................ √ △ 3/5
........................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

# අ.පො.ස. (උ.පෙළ) විභාගය 2024

# ලකුණුදීමේ පටිපාටිය

## II පත්‍රය

## I කොටස

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයයේ දෙවන පත්‍රයේ පළමු කොටස, ප්‍රශ්න තුනකින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරයි.

1. ශිෂ්ටාචාරයේ සම්භවය, එක් ශිෂ්ටාචාරයක එනම්, නයිල් ගංගා නිම්න ශිෂ්ටාචාරයේ ලක්ෂණ, ශිෂ්ටාචාරයේ ප්‍රධාන අංගයක් වන භාෂාව එනම් ලතින් භාෂාව සමාජ සංවර්ධනයට දායක වූ අන්දම මෙන්ම ශිෂ්ටාචාරය සහ සංස්කෘතිය අතර සමාන අසමානතා අධ්‍යයනය මගින් ශිෂ්ටාචාරයන්ගේ භූමිකාව පිළිබඳ සිසුදැනුම විමර්ශනය කෙරේ.

2.ඊශ්‍රායෙල් ඉතිහාසයේ විනිශ්චයකරුවන් සහ අපරවිප්‍රවාසි යුගයේ ප්‍රබෝධය පිළිබඳ දැනුම ද ක්‍රිස්තුවර්ෂ පළමුවන සියවසෙහි දිවිගෙවූ එක්තරා ප්‍රධාන ජන කණ්ඩායමක් වූ සමරිතානුවරුන්ගේ ජීවිතක්‍රමය මෙන්ම නාසරතයේ ජේසුන්වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීම් පිළබඳ දැනුම ද විමර්ශනය කෙරේ.

3. ක්‍රිස්තියානි ඉතිහාසයේ ප්‍රධාන අංග වන ක්‍රිස්තියානි කලාව, සාහිත්‍යය සහ ඉතිහාසය පිළිබඳ දැනුම විමර්ශනය කෙරේ. ඒ පිළිබඳව පුනරුද යුගයේ කලාව සහ බ්‍රිතාන්‍ය සමයේ ශ්‍රීලංකාවේ කලාව සහ සාහිත්‍යය ද චීන දේශයේ ක්‍රිස්තියානි ඉතිහාසය ද සම්බන්ධ දැනුම පරික්ෂා කෙරේ.

## II කොටස

මෙම කොටසෙහි ප්‍රශ්න පහක් ඇතුලත් වන අතර ඉන් ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. මෙම කොටසෙහි එක් එක් ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වන අතර මුල් කොටසෙහි විෂය දැනුම සහ දෙවන කොටසෙහි එම දැනුම ප්‍රායෝගිකව අදාළ කරගත හැකි අන්දම පිළිබඳ හැකියාව ඇගයීමට ලක් කෙරේ.

4. ජුදා සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කර එම විෂය දැනුම ඇසුරෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතිය ක්‍රිස්තියානි සංස්කෘතියට දායකවූ අන්දම සහ ක්‍රිස්තියානි සංස්කෘතිය ශ්‍රී ලාංකේය සංස්කෘතියට දායකවූ අන්දම අධ්‍යයනයට භාජනය කිරීම අපේක්ෂා කෙරේ.

5. නාසරතයේ ජේසුන්වහන්සේගේ දිවියේ අවසාන සිදුවීම් පිළිබඳ මාක්, මතෙව්, ලූක් සහ ජොහාන් ශුභාරංචිවල වාර්තාගත කරුණු ඉදිරිපත් කර සාධාරණත්වය සහ සාමය අරභයා සාධාරණත්වය සහ සාමය සඳහා අරගලවල යෙදී සිටින ජනතාවනට ජේසුන්වහන්සේගේ ජීවිත පරිත්‍යාගය ආදර්ශයක් වන්නේ කෙසේදැයි සාකච්ඡා කිරීමේ හැකියාව විමර්ශනය කෙරේ.

6. යුරෝපයේ ප්‍රධාන පැවිදි නිකායක් වන බෙනදිකාන තාපස නිකායිකයින් යුරෝපීය ගෝත්‍රවල දියුණුවට දායකවූ අන්දම පිළිබඳ දැනුම යොදාගනිමින් දේශය ගොඩනැංවීමෙහිලා ආගමික අධ්‍යාපනයේ කාර්යභාරය කුමක් විය යුතුදැයි සාකච්ඡා කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කෙරේ.

7. බටහිර සභාව ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා තෝමස් මුන්ස්ටන් තුමාගේ දැක්ම පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම සහ ශ්‍රී ලාංකේය සන්දර්භයේ සභා නවෝදය අරභයා කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ විමසාබැලීමේ හැකියාව අපේක්ෂා කෙරේ.

8. පරිසරය සුරැකීමේ වැදගත්කම පිළිබඳ ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ඉගැන්වීම් ඉදිරිපත් කර පරිසරය සුරැකීම අරභයා සිසුසිසුවියනට දායකවිය හැකි අන්දම පිළිබඳ නිර්මාණශීලි අදහස් ඉදිරිපත් කිරීම විමර්ශනය කෙරේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂයය අංකය / பாட இலக்கம்: 49 | විෂයය / பாடம்: ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 4 | 31. | 1 | 41. | 5 |
| 02. | 5 | 12. | 3 | 22. | 5 | 32. | 5 | 42. | 2 |
| 03. | 1 | 13. | 3 | 23. | 4 | 33. | 2 | 43. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 3 | 34. | 2 | 44. | 2 |
| 05. | 5 | 15. | 4 | 25. | 5 | 35. | 4 | 45. | 1 |
| 06. | 1 | 16. | 1 | 26. | 4 | 36. | 3 | 46. | 3 |
| 07. | 1 | 17. | 3 | 27. | 2 | 37. | 1 | 47. | 2 |
| 08. | 2 | 18. | 4 | 28. | 5 | 38. | 4 | 48. | 5 |
| 09. | 1 | 19. | 3 | 29. | 3 | 39. | 1 | 49. | 2 |
| 10. | 3 | 20. | 5 | 30. | 4 | 40. | 4 | 50. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය

## I කොටස

**1.(i) ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ කරුණු හතරක් ලියන්න (ලකුණු 02 යි)**

- මානවයා ආහාර ලබාගත හැකි ස්ථානවල පදිංචිවීම
- ගංගා නිම්න ආශ්‍රිතව කුඩාරම් තනාගෙන කණ්ඩායම් වශයෙන් ජීවත්වීම
- මුල්ම ශිෂ්ටාචාරයන් යුප්‍රටීස් සහ ටයිග්‍රීස් ගංගා නිම්න ආශ්‍රිතව මෙසපොතේමියාවේත් බැබිලෝනියාවේත නයිල් ගංගා නිම්නය ආශ්‍රිතව මිසරයේ හෝ ඊජිප්තුවේ ඉන්දු ගංගා නිම්නය ආශ්‍රිතව ඉන්දු ගංගා නිම්නයේත් බිහිවිය
- මෙකී ශිෂ්ටාචාරයන්හි ගොවිතැන හා සම්බන්ධ වඩුවැඩ, කම්මල් වැඩ, ආයුධ නිෂ්පාදන ආදිය සිදුවිය
- ක්‍රමයෙන් නාගරීකරණය සිදුව අතර විවිධ වෘත්තීන් ව්‍යාපාර කටයුතු, පාලන ක්‍රම, විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය කලාවේ වර්ධනය අක්ෂර බිහිවීම, ජ්‍යොතිෂය බිහිවීම ආදිය සිදුවිය
- ශිෂ්ට යන්නෙන් විනීත, ආචාරශීලි වැනි අදහස ගම්‍ය වෙයි.

**1. (ii) නයිල් ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු හතරක් ලියන්න (ලකුණු 04 යි)**

- පැරණීම සංස්කෘතිය ලෙස සැලකෙයි
- පාලනය, ආර්ථිකය, සංස්කෘතිකාංග මැනවින් දියුණුවී තිබිණි.
- ඊජිප්තුවේ/ මිසරයේ නයිල් ගඟ ආශ්‍රිතව බිහිවූවකි.
- සරුසාර ප්‍රදේශයක් විය. ඉරිඟු, තිරිඟු, මිලට් ආදිය වගා කෙරිණි.
- රජගේ පාලන බලය දෙවියන්ගෙන් ලැබූවක් සේ සැලකුණි
- පාලනය, ආගම, ආර්ථිකය එනට සම්බන්ධවී පැවතුණි
- දෙවිවරුන් හා අශුද්ධාත්මයන් ද ඔවුන්ගේ බලය කෙරෙහි ද විශ්වාසය තබා ක්‍රියා කළහ.
- මරණින් මතු ජීවිතයක් ඇතිබව මුලින්ම විශ්වාස කළේ ඊජිප්තු ජනතාවයි
- ගොඩනැගිලි, මූර්ති සහ චිත්‍ර කලාව ශිෂ්ටාචාරයත් සමග වර්ධනය විය.
- ගණිතය, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂය ආදිය වැඩිදියුණුවීම.

**1.(iii) ලතින් භාෂාව සමාජ සංවර්ධනයට දායකවූ ආකාරය විස්තර කරන්න**
**(ලකුණු 06යි)**

**1.(iii) ලතින් භාෂාව සමාජ සංවර්ධනයට දායකවූ ආකාරය විස්තර කරන්න (ලකුණු 06යි)**

- රෝම අධිරාජ්‍ය පාලන සමයේ පාලන භාෂාව ලතින් විය
- බොහෝ යුරෝපීය භාෂාවන් බිහිවීමට මුල්විය (එම භාෂාවන්ගේ මුල් බස ඉතාලි, ස්පාඤ්ඤ, පෘතුගීසි, ප්‍රංශ, රුමේනියා)
- ඉංග්‍රීසි භාෂාවේ බොහෝ වචනවලට මූලය විය.
  (නීති, වෛද්‍ය විද්‍යා සහ අධ්‍යාපන අංශවල ලතින් භාෂාවේ වචන භාවිත විය)
- වසර 1000නට අධික කාලයක් විද්වතුන්ගේ භාෂාව විය
- රෝමානු කතෝලික සභාවේ නිල භාෂාව ලෙස ගැනෙයි

**1.(iv) ශිෂ්ටචාරය සහ සංස්කෘතිය අතර සමාන සහ අසමානතා (ලකුණු 08යි)**

**සමානකම්**

- සමාජයේ වර්ධනය හා පැවැත්ම පිළබඳව කරුණුවලදී ශිෂ්ටාචාරය සහ සංස්කෘතියය න වචන යොදා ගනී.
- සෑම ජාතියකටම අනන්‍යවූ ශිෂ්ටාචාරයක් සහ සංස්කෘතියක් ඇත
- ශිෂ්ටාචාරය සහ සංස්කෘතිය වෙනස්වීම සහ වර්ධනය වන ස්වභාවයක් ඇත

**අසමානකම්**

- ශිෂ්ටාචාරය මානව සමාජයේ වර්ධනයට හේතු වන කරුණු අඩංගු වෙයි
- සංස්කෘතිය, ජීවන චර්යාව, සිරිත් විරිත් වටිනාකම් ආදිය සලකා බැලෙයි
- ශිෂ්ටාචාරය භෞතික දේ අඩංගු වෙයි. ක්‍රමානුකූල වර්ධනයක් වේ. සංස්කෘතිය භෞතික දේ අඩංගු නොවෙයි
- ශිෂ්ටාචාරය, සමාජයේ ක්‍රමික වර්ධනය සැලකිල්ලට ගැනෙයි. විවිධ සමාජ පන්ති විශාල ජන කණ්ඩායම් තුළ දැකිය හැකිය. සංස්කෘතිය ජන කණ්ඩායමක් තුළ අන් අය සමග ජීවත් වීමේදී සකස්කරගන්නාවූ වටිනාකම් විශ්වාසයන් ආදිය ඇතුළත්ය.
- ශිෂ්ටාචාරය හැකියාවන් මෙන්ම ද්‍රව්‍යමය දේ සමග සම්බන්ධය
  සංස්කෘතිය අධ්‍යාත්මික ගුණාංග, වටිනාකම් වැඩියෙන් දැකිය හැකිය.
- ශිෂ්ටචාරය සංස්කෘතියට පෙර බිහිවූවකි. සංස්කෘතිය ශිෂ්ටාචාරය තුළ බිහිවන්නකි.
-

**2.(i) ඊශ්‍රායෙලයේ විනිශ්චයකාරවරුන් හතරදෙනෙකු නම් කරන්න (ලකුණු 02 යි)**

- ජොෂුවා
- ඔත්නියෙල්
- දෙබෝරා
- ගිඩියොන්

- අබිමෙලෙක්
- ජෙප්තා
- සම්සොන්
- සාමුවෙල්

**2. (ii) අපරවිප්‍රවාසි සමයේ ජුදා නවෝදය පිළිබඳ කරුණු හතරක් දක්වන්න (ලකුණු 04 යි)**

- පර්සියාවේ සයිරස් රජ ජුදා ජනතාවට ආපසු තම දේශයට ගොස් නිදහසේ ජීවත්වීමට ඉඩ සැලසීය
- ජෙරුසලම් දේවමාළිගාවෙන් සොරාගත් රන් රිදී පාත්‍ර ආදිය ද නැවත ලබාදීමට කටයුතු කළේය.
- බැබිලෝනියාවේ සිට ආපසු පැමිණි ජුදාවරුන් තුළ ආගමික, සංස්කෘතික සහ සමාජයීය නවෝදයක් ඇතිවිය
- එස්රා, නෙහෙමියා යන අයගේ නායකත්වය යටතේ මෙම නවෝදය සිදුවිය
- එස්රා ජුදා අණපණත් අනුව ජීවත්වීමට අවශ්‍ය කටයුතු සිදුකළේය.
- ජුදා වන්දනාව නැවත පිහිටුවා ගිවිසුමට මූලික තැනක් දුන්නේය.
- නෙහෙමියා විසින් ජෙරුසලම වටා පවුර ගොඩනැගීය

**2.(iii) ජේසුස් වහන්සේ ජීවත්වූ සමයේ සමරිතානුවරුන්ගේ ජීවිත ක්‍රමය පිළිබඳ විස්තර කරන්න (ලකුණු 06යි)**

- සමරිතානුවරු සමාජයේ පහත්ම ලෙස සලකනු ලැබූ අය අතරට අයත්වෙයි
- සමරිතානුවරු බෙදුම්වාදී කණ්ඩායමක් ලෙස ජුදයන් විසින් සලකන ලදි
- ජුදාවරු සමරිතානුවරුන් ජාතියේ ශුද්ධත්වය නැතිකරගත් අය ලෙස සලකා කොන් කළහ.
- ජුදාවරු සමාරිය මැදින් යාමට හෝ සමරිතානුවරුන් සමග බතා කිරීමට අකමැති වූහ.
- ජේසුස් වහන්සේ සමරිතානුවරුන් පහත් කොට නොසැලකූ අතර ඔවුන් සමග සබඳතා පැවැත්විය
- සමාරිය මැදින් යාම, සමරිතානු ස්ත්‍රිය සමග කතා කිරීම සමරිතානුවරයෙකු සම්බන්ධකොට උපමාවක් වැදෑරීම වැනි දේ එයට නිදසුනකි

**2.(iv) කෝපය, පළිගැනීම සහ සතුරන්ට ප්‍රේමකිරීම සහ උපවාසය පිළිබඳව ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන්න (ලකුණු 08යි)**

ඉහත කී ඉගැන්වීම් ගැන සඳහන් වන්නේ උන්වහන්සේගේ කන්ද උඩ දේශනය තුළයි

කෝපය

- පුරාණ ගිවිසුමෙහි මිනීමැරීම ගැන සඳහන් කිරීමේදී ජේසුස්වහන්සේ උගන්වන්නේ කෙනෙකු සමග කෝපවීමම යමෙකු අධිකරණයේ විනිශ්ඩයට හේතු වන බවයි
- කොපයෙන් කරන සියල්ලේදී කෙනෙකු සමග සමග සබඳතා පලුදු වෙයි. ප්‍රේමය පහව යයි. කෙනෙකුට අයුතු චෝදනා එල්ලකිරීමට හේතුවෙයි
- අන් අය කෙරෙහි ගෞරවය නැති වෙයි
- මේ නිසාම කෝපය එක් අතකින් මිනීමැරීමකට සමාන වන්නකි
- මේ නිසා කෝපවීමෙන් වැලකී සිටීමට ජේසුස්වහන්සේ උගන්වයි

පළිගැනීම

- පුරාණගිවිසුමේ ඇසට ඇස, දතට දත යන ඉගැනවීම් පාදක කොටගෙන පළිගැනීමේ විපාක ගැන ජේසුස් වහන්සේ අපට උගන්වන සේක
- පළිගැනීම මගින් තම සොහොයුරාට වෛරයෙන් කෝපයෙන් ක්‍රියාකරන බව පෙන්නුම් කරයි
- එලෙසම පළිගැනීමට යාමේදී අප සමහරවිට අප කළ වරදට වඩා බොහෝ වාරයක් වැඩි විපතක් එසේ වරදකරුවා වෙත එල්ලකිරීම දසිදුවිය හැකිය
- එය සීමාව ඉක්මවා යාමක්ද සිදුවිය හැකිය
- එහෙයින් පළිගැනීමෙන් වැළකී සිටීමට ජේසුස්වහන්සේ අපට උගන්වන සේක

සතුරන්ට ප්‍රේම කිරීම

- අප අපේ මිතුරන්ට සහ අපගේ ජීවිතයට සම්බන්ධ අයට පමණක් ප්‍රේම කර සතුරන්ට වෛර කරන්නේ නම් එය ප්‍රේමය නොවේ
- මන්ද ඕනෑම අයෙකු තමාගේ ජීවිතයට සමීප අයට ප්‍රෙම කරන බැවිනි. ඔවුන්ට උදව් උපකාර කරන බැවිනි
- ක්‍රිසතුස් වහන්සේ මෙසේ පවසන සේක එනම්, එක් පිරිසක් සතුරන් සේ සැලකීම දේවරාජ්‍යය පිළිබඳ අදහසට පටහැණිය

උපවාසය

- ජුදා ආගම අනුව උපවාසය මනස්ථාපනය වීමේ සංකේතයක් ලෙස අනුසාර කරනු ලැබේ

- ජුදයන්ගේ පශ්චත්තාපකී මෙහෙයවල දී ඔවුහු පොදුවේ උපවාස කළහ. එහෙත් තනිවම උපවාස කිරීමේ සිරිතක් ද විය
- මිනිසුන්ට පෙනෙ ආකාරයට උපවාස කිරීම වෙනුවට රහසිගතව උපවාස කිරීම
- උපවාසය තමන් පිරිසිදුවීම, හිස්වීම හා තම නොහැකියාව වටහා ගැනිම සඳහා කරන පරිත්‍යාගී ක්‍රියාවකි.

**3.(i) පුනරුද සමයේ චිත්‍ර ශිල්පීන් හතරදෙනෙකු නම් කරන්න (ලකුණු 02 යි)**

- පෙට්ටි
- සෙල්ලි ( බොටිච්චෙල්ලි)
- පියාටෙර් ටැක්සියෝ (පියාත්‍රෝ පෙරුජිනෝ)
- වසාරි (ජෝර්ජියෝ වසාරි)
- මසක්කියෝ (තෝමස් මසාච්චියෝ)
- මයිකල් ඇන්ජලෝ
- ලියනාඩෝ ඩාවින්චි
- රෆායෙල්

**3. (ii) වර්ණ වීදුරුකලාව පිළිබඳ කරුණු හතරක් දක්වන්න (ලකුණු 04 යි)**

- ගොතික් ගොඩනැගිලි කලාවේ අංගයක් ලෙස බිහිවිය
- විශාල ජනේල වල තිබූ වීදුරුවල චිත්‍ර ඇඳීම සිදුවිය
- මෙහිදී වීදුරු තුළට වර්ණ ඇතුළත් කොට ඇඳ තිබුණි
- වීදුරු තුළට පාට කැවීමේ ක්‍රමය ගොතික් කලාකරුවන් රහසිගතව තබාගැනීම නිසා පැරණි ක්‍රම අභාවයට ගොස් ඇත

**3.(iii) චීන දේශයේ ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරන්න (ලකුණු 06යි)**

- 16 වන සියවසෙන් පසු පැතිර ගියේය
- මූලික වූයේ මතෙව් රිච් පියතුමාය. එතුමා ක්‍රි.ව. 1552 දී උපත ලැබීය
- ක්‍රි.ව. 1583 චීනයේ ධර්මදූත සේවය කිරීමට චීන බලධාරීනගෙන් අනුමැතිය ලබා කැන්ටන් ප්‍රදේශය අසල ජීවත්විය
- මෙතුමා චීන සංස්කෘතිය හා ශිෂ්ටාචාරයට ගරුකරන පුද්ගලයෙකු ලෙස දැකිය හැකිය
- චීන බුද්ධිමතුනගේ වස්ත්‍ර හැඳ චීනයේ සිරිත් විරිත් අනුගමනය කළේය.
- ගණිතය, නක්ෂත්‍ර, භූමි ශාස්ත්‍රය , සංගීතය, දර්ශන ග්‍රන්ථ ආදිය චීන භාෂාවෙන් ලිවිය
- චීන භාෂාවෙන් "සත්‍ය දේව ගුණාංග"යන ග්‍රන්ථය ලිවීය. එය විශිෂ්ට චීන සාහිත්‍ය ග්‍රන්ථයකි

- චීන දාර්ශනිකයෙකුවූ කොන්ෆියුසියස්ගේ දර්ශනය තම දහම් දෙසුමට උපයෝගි කරගෙන පුරාතන චීන සංස්කෘතියට ගරුකර, එහි සමහර ක්‍රම තම දහමේ වන්දනා ක්‍රමවලට එක්කර ගත්තේය
- ලෝකය මැවීම පිළිබඳව චීන ජාතිකයන්ගේ පුරාණ කථා උපයෝගී කරගනිමින් ශු. බයිබලයේ ඇති මැවීමේ කථා පැහැදිලි කළහ

**3.(iv) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය සමයේ ක්‍රිස්තියානි කලා සහ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න (ලකුණු 08යි)**

- බ්‍රිතාන්‍ය යුගයේදී ලන්දේසි යුගයේ යටපත්වී තිබූ නාට්‍ය කලාව සහ සාහිත්‍යය නැවත එළිදැක්වීමක් දක්නට ලැබෙයි
- "නාට්ටු කුත්තු" නමින් හැඳින්වූ වීදිනාට්‍ය නැවත වරක් වේදිකාගත කිරීම ඇරඹුණි
- මිෂනාරීවරුන් විරෝධයක් පෑවද වේදිකාගත වූ බවට සාක්ෂි වේ
- දෙමළ නාට්ටු කුත්තු සිංහල නාට්‍ය වැඩිවර්ධනයට හේතු විය
- සිංහලෙන් පළමුවෙන්ම වේදිකාගත කරන ලද්දේ රජතුන් කට්ටුව නමැති නාට්‍යයයි
- මෙය සිංහලයට පරිවර්තනය කරන ලද්දේ හලාවත ගේබ්‍රියෙල් ප්‍රනාන්දු නමැත්තෙකි
- චිත්‍ර සහ මූර්ති කලාවේ ද වර්ධනයක් විය
- බෙසල්ලේ නවරත්න නමැත්තා පේරාදෙණියේ ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ලී කැටයම් ඇතුළත් දේවස්ථානය ගොඩනැගීමට දායක විය
- ලී කුළුණුවල කිතුනු සංකේත දක්නට හැකිය
- පෝල් නවරත්න නමැත්තා විසින් කිතු උපත පිළිබඳ චිත්‍රය ඇඳ තිබේ.
- බ්‍රිතාන්‍ය පාලන සමයේ සාහිත්‍යය ගත් කල සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙහිම සාහිත්‍ය වර්ධනයක් දැකිය හැකිය
- 1866 දී ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත ආරම්භ වූ අතර ද මැසෙන්ජර් පුවත්පත ඉංග්‍රීසි බසින් පළ විය. 1889 දී භක්ති ප්‍රබෝධනය කිතුනු සඟරාව බිහිවූ අතර සිංහල බසින් බිහිවූ පැරණිතම පුවත්පත සහ සඟරාව මෙය වේ
- ඉංග්‍රීසි ජාතික මිෂනාරිවරුන් විසින් දෙමළ සාහිත්‍යය නැංවීමට විශාල සේවාවක් සිදුකරනු ලැබූහ. 1841 දී උයද තාරගෛයි නමැති දෙමළ කිතුනු පුවත්පත ආරම්භ කරන ලදි

4. i **ජුදා සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.**

* ජුදා සමාජයේ දරුවන්ගේ මූලික අධ්‍යාපනය මවට භාර වේ.
* ආගමික පිළිවෙත්, සමාජ හැසිරීම් ළමා වියේ දී මවගෙන් ඉගෙන් ගත යුතුය.
* වයස අවුරුදු 6 දී දරුවන්ගේ අධ්‍යාපනය පියාගේ භාරකාරත්වයට යටත් වේ.
* දහම් පාසල්වල ආගම නීති රීති කට පාඩම් කර ඉගෙන ගත යුතුය.
* ක්ෂමා යාච්ඤාව, නීති සංග්‍රහ, ප්‍රඥා සාහිත්‍ය වැනි ඉගැන්වීම් සිදු කිරීම පියාගේ වගකීමයි.

* වාචික ඉගැන්වීම මගින් ඉගෙන ගන්නා ලදී.
* ශබ්දනගා කියවා, කටපාඩම් කර ඉගෙන ගන්නා ලදී.
* සමහර දරුවන්ට පියවරුන්ගේ රැකියා සම්බන්ධ අධ්‍යාපනයක් ද දෙන ලදී.
* ඉතිහාසය, භූගෝලය, ව්‍යාකරණ ආදිය ද බයිබල් පසුබිම මගින් ඉගෙන ගැනීමට ද සිදු වේ.

**4. ii ශ්‍රී ලාංකේය සංස්කෘතිය කෙරෙහි ක්‍රිස්තියානු සංස්කෘතියේ දායකත්වය සහ ක්‍රිස්තියානු සංස්කෘතිය මත ශ්‍රී ලාංකේය සංස්කෘතියේ බලපෑම සාකච්ඡා කරන්න.**

* පැරණි ජුදා අධ්‍යාපන ක්‍රමය පවුල හා රැඳී තිබූ අධ්‍යාපන ක්‍රමයකි.
* දරුවන්ගේ අධ්‍යාපනය මව සහ පියාගේ බලපෑම හා වගකීම ඉතා තදින් දක්නට හැකි විය.
* දරුවන්ගේ ජීවිතයට අවශ්‍ය සදාචාරය, ආගමික සිරිත් විරිත්, ජුදා සමාජ සම්ප්‍රදායන් කියා දීම මව සහ පියා මත පැවරුණු වගකීමකි.
* මේ හැරෙන්නට එක එක පවුල්වලට ආවේණික වූ රැකියා ආදිය ගැන කියා දීම ද දෙමව්පියන්ගේ යුතුකම හා වගකීමක් වූයේය.
* මේ නිසාම සමාජයේ සිටින සියලු දෙනාම උස් පහත් දුගී හෝ ධනවත් භාවයෙන් තොරව ජීවිතය පිළිබඳව අවබෝධයක් සහ දැනීමක් ලබා ගැනීමට අවස්ථාව හිමි විය.
* වත්මන් අධ්‍යාපනය සමාජය හා බැඳුණු අධ්‍යාපන ක්‍රමයකි.
* අධ්‍යාපනය මෙහෙය වන ප්‍රධාන නියමුවා ද වන්නේ රජයයි.
* පුද්ගලික කණ්ඩායමක් විසින් අධ්‍යාපනය මෙහෙය වන අවස්ථාවකදී වුව ද එම පිරිස් වෙත ප්‍රතිපත්ති, නීතිරීති සහ අවශ්‍යතා අනුව එය කළ යුතු වෙයි.
* අධ්‍යාපනයට දරුවන් මෙහෙය වීම දෙමාපියන් විසින් සිදු කලද අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන්ගේ සම්බන්ධතාවය එතරම් පුළුල් එකක් නොවේ.
* වෘත්තීන් තොරා ගැනීමේ දී ද, දෙමාපියන් කළ වෘත්තීන් තෝරා ගැනීම හෝ ඒ සඳහා පුහුණුවක් දීම නූතන අධ්‍යාපන ක්‍රමයේ සිදු නොවේ.
* විශේෂයෙන්ම සදාචාරය වැඩි වර්ධනය කිරීම අවශ්‍ය වුවද එය අධ්‍යාපන ක්ෂේත්‍රයට අයිති ක්‍රියාවක් ලෙස නූතන අධ්‍යාපන ක්‍රමය මත සිදු නොවේ.
* පැරණි ජුදා අධ්‍යාපන ක්‍රමය මගින් මනුෂ්‍යයා කෙරෙහි වැඩි සැකිල්ලක් දැක්වීම දැකිය හැක.
* යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා සදාචාරය දෙමාපියන් දරුවන් අතර සම්බන්ධය, ආගමික අධ්‍යාපනය අවශ්‍ය වේ.
* පැරණි ජුදා අධ්‍යාපනය තුළ මෙය දක්නට ලැබේ.
* නමුත් එක එක පුද්ගලයාට ස්වාධීනව කටයුතු කිරීමට තමා කැමති වෘත්තියක් තෝරා ගැනීම ආදිය තිබූ අවස්ථාව අඩුය.
* එහෙත් නව අධ්‍යාපන ක්‍රමය තුළ මනුශ්‍ය සදාචාරය පවුල සමග තිබුණු සම්බන්ධතාව ආදිය ඇතුළත් නොවේ. ඒ වෙනුවට පුද්ගලයාට තමාගේ කැමැත්ත අනුව අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි වේ.

**5. I ජේසුස්වහන්සේගේ දුක් විඳීම සහ මරණය පිළිබඳ සම්මත සුභ ආරංචි හතරෙහි සඳහන් තොරතුරු මොනවාද?**

* පාස්කු අභිරහසෙහි මූලිකාංගයක් වූ ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානය යන ත්‍රිවිධ සිද්ධීන් සුභාරංචි හතරෙහිම සඳහන් වෙයි.
* එයින් පෙනී යන්නේ මුල් සභාව තුළ පාස්කු අභිරහස ඉතා වැදගත් තැනක් ඉසිලූ බවයි. ක්‍රිස්තුස් වහන්සේගේ පවා දීම, මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙන යාම, පිලාත් ඉදිරියට ගෙන යාම සහ විනිශ්චය දුක් විඳීම, කුරුසේ ඇණ ගැසීම, කුරුසය මත උකුත් වීම, දුක් විඳීම හා මරණය පිළිබඳ ප්‍රධාන අවස්ථා වේ.
* ශුද්ධ වූ මතෙව්තුමාට ජේසුස් වහන්සේගේ දුක් විඳීම සහ මරණය උන්වහන්සේ තුළ ලබා ගත්තා වූ ගැලවීම ප්‍රත්‍යක්ෂ කිරීමකි.
* මාක්තුමාට එය අන්ධකාරය පරදා අලෝකය ජයග්‍රහණය කිරීමේ සලකුණ වේ
* ලූක් තුමන්ට අනුව මරණය දුක්විඳීමේ ඵලයයි.
* ජුවාම් තුමාට අනුව ජේසුස් වහන්සේ මරණය ප්‍රේමයේ උතුම්ම ඵලයයි. ජේසුස් වහන්සේගේ මෙලොව ජීවිතය අවසන් කර පියාණන් වෙතට යාමේ මාර්ගය වූයේ දුක් විඳීම සහ මරණයයි.
* ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ දුක් විඳීම සහ මරණය ගැන බොහෝ අවස්ථාවලදී වදාළ සේක. (මාක් 8:31, 9:31, 10:33/මතෙව් 23:29-31)
* එලෙසම තමන් වහන්සේගේ මරණයේ අවශ්‍යතාවය ගැන හා එමගින් සියල්ලන්ගේ ගැලවීම ඉටු වන බව ද බොහෝ අවස්ථාවලදී ප්‍රකාශ කළ සේක. (මතෙව් 20:28) ජොහාන් 11:17-18, 15:13
* ජේසුස් වහන්සේගේ දුක් විඳීම සහ මරණය මුල් සභාවේ කේන්ද්‍රීය පණිවිඩය හා උන්වහන්සේ ගැන දේශනා කිරීමේ දී ප්‍රධාන මාතෘකාව වූ බව සුභාරංචි කතුවරුන්ගේ හා ශුද්ධ වූ පාවුලු තුමන්ගේ ඉගැන්වීම් වලින් ද දැකිය හැක. (ක්‍රියා 2:22-24)

**5. ii සාධාරණත්වය සහ සාමය අරභයා අරගලයක යෙදී සිටින ජනතාවට ජේසුස් වහන්සේගේ දුක්විඳීම සහ මරණය අදාළ වන ආකාරය පැහැදිලි කරන්න.**

* ජේසුස් වහන්සේගේ මෙලොවට පැමිණියේ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමටයි. දේව රාජ්‍යය මෙලොව රාජ්‍යයන්ට වඩා වෙනස් වූවකි. එය බලය හිමි කර ගැනීමේ රාජ්‍යක් නොව ශුද්ධ වූ පාවුලු තුමන් පවසන ආකාරයට සාමයේ ප්‍රේමයේ සාධාරණත්වයේ සහ යුක්තියේ රාජ්‍යයකි. එවැනි රාජ්‍යයක් පිහිටුවීමට නම් පළමුවෙන් පාපය තුරන් කළ යුතු වෙයි. පාපය තුරන් කළ හැක්කේ පාපයට තුඩු දෙන කාර්යන් වන අත්මාර්ථකාමීත්ව, අයුක්තිය, අසාධාරණත්වය වැනි දේ පතුරුවන සංස්ථා පිටු දැකීමය. එහෙයින් ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශණය සහ අනෙකුත් ඉගැන්වීම් මගින් දේව රාජ්‍යයේ ගුණාංග සහ එම ගුණාංග ප්‍රගුණ කිරීමට කළ යුතු දේ දේශණා කළ සේක. පව්කරුවා විනාශ නොකට පාපය විනාශ කළ හැක. සුවය ලැබීමට ආ අයට පවුකමාවද දානය කළ සේක.

* එහෙත් එතැනින් නොනැවතුනු ජේසුස් වහන්සේ පාපකාරී සංස්ථා වෙත අයුක්තිය, අසාධාරණය, ආත්මාර්ථකාමිත්වය පතුරන්නන් හට දුගීන් තලා පෙලා ක්‍රියාකළවුන්ට තම දේශණා මගින් නොබියට පහර දුන් සේක. එහෙත් මේ සියල්ල උන් වහන්සේ කළේ තමන් වහන්සේ ද වෛරය, කෝපය පතුරවමින් නොව අහින්සාවාදී මාර්ගයෙනි. තමන් අන් අයගේ ජීවිත ගැනීම වෙනුවට තම ජීවිතය කුරුසය මත පූජා කිරීමය.
* අප ජීවත් වන දේශයද අයුක්තියෙන් අසාධාරණයෙන් ආත්මාර්ථකාමීත්වයෙන් පිරී ඇත. බලවතුන් දුගීන් යටත් කොට ගෙන ඔවුන් සූරා කමින් තමන් පමණක් සියලු සැප සම්පත් භුක්ති විඳීමට පෙළඹී ඇත.
* මනුෂ්‍ය ජීවිතයට වඩා තම බලයට, මුදල් ඉපැයීමට මුල් තැන දී ක්‍රියාකරමින් අන් අයගේ ජීවිත ගැන කිසිදු තැකීමකින් තොරව ක්‍රියාකරමින් සිටිති. සැබවින්ම මෙම තත්ත්වය වෙනස් කළ යුතුව ඇත. එහෙත් අය කරන්නේ කෙසේ ද.වෛරය නැසීමට වෛරය උපයෝගී කර ගනිමින්ද, පාපය නැසීමට පාපය උපයෝගී කර ගනිමින් ද නැත. එය සාධාරණ ලෙෂ අන් අය පීඩාවට පත් නොකොට, අන් අයගේ ජීවිත විනාශ නොහැක කළ යුත්තකි.
* ජනතාව තම පීඩාව නැති කර ගැනීමට නැගී සිටිය යුතු නමුදු එය අන් අය පීඩාවට පත් නොකොට කළ යුත්තකි. එහෙත් එවැනි ක්‍රියාමාර්ග ගන්නන්ට ලෝකයට විරුද්ධව නැගී සිටීම සැම විටම සිදු වන්නකි. අප ද සැම විටම උත්සහා කරන්නේ ආලෝකය ජය ගැනීමය. එය නොකළ හැකි වුව ද පාපයෙන්, අසාධාරණයෙන්, ආත්මාර්ථකාමීත්වයෙන් ගැලී සිටිනම් එය ඉටු කර ගැනීමට සැම උත්සහයක්ම දරති.
* අන් අයගේ යහපත සඳහා යම් දෙයක් කිරීමේ දී තමන්ට විරුද්ධයාදීන් සිටින බව තමන්ට විරුද්ධව නැගී සිටින බව දැන එහෙත් ඉවසීමෙන් හා කැපවීමෙන් හා සාමකාමී මගෙහි ගමන් කිරීමෙන් ක්‍රියා කළ යුතු ය.
* ජේසුස් වහන්සේ පැවසූ ලෙස "යුක්තිය උදෙසා පීඩාවිදින්නෝ භාග්‍යවන්තයෝය. මන්ද ඔවුන් සැනසීම ලබන්නෝය" යන ප්‍රකාශය නිසි ලෙස වටහා ගත යුතු ය.

**6. I යුරෝපීය ගෝත්‍රයන් ශිෂ්ඨත්වයට පත් කිරීමට බෙනදිකාන නිකායෙන් සිදු වූ දායකත්වය විස්තර කරන්න.**

* යුරෝපීය ගෝත්‍රකයින්ගේ ආක්‍රමණ සමාජයට විශාල තර්ජනයක්ව තිබූ සමයක රඩගුරුවරුන් ඔවුන් සමග සම්මුති වලට එළඹෙමින් ඔවුන් සමග එකට ක්‍රියාකිරීම ඇරඹීය. මෙවන් පරිසරයක් මැද ගෝත්‍රිකයන් ශිෂ්ඨසම්පන්න කිරීම පිණිස බෙනදිකාන තාපස නිකායෙන් සිදු වූ සේවාව අතිවිශිෂ්ටය.
* බෙනදිකාන තාපසයෝ තම ගෝත්‍රිකයන් අධ්‍යාපනය කරා යොමු කළහ. ග්‍රීක රෝම ශිෂ්ඨාචාරයේ වැදගත් දේ ගෝත්‍රිකයන්ට දැන ගැනීමට සැලසූහ.
* එලෙසම ලතින් භාෂාව ද ඔවුන්ට උගන්වන ලදී.
* බෙනදිකාන නිකායේ අධ්‍යාපනික ක්‍රියාකලාපය නිසා යුරෝපීය ගෝත්‍රයන් ක්‍රමයෙන් ශිෂ්ඨත්වයට පත් වූහ.

* එලෙෂ ගෝත්‍රික ජනතාව තාපසාරාම අසල පදිංචි කරවා ඔවුන්ට ගොවිතැන් කිරීමට පුරුදු කළහ. ස්ථිර වාසස්ථානයක් නොමැතිව තැනින් තැන යාමට වඩා ස්ථිර ලෙස පදිංචි වී ගොවිතැනට හුරු වීම වඩා ඵලදායී බව බෙනදික්තන තාපසයෝ ගෝත්‍රිකයින්ට පහදා දුනි.
* මේ හැරෙන්නට තපසාරාම තුළ තාක්ෂණික පාසල් පිහිටුවා ගෝත්‍රිකයින්ට ගොවිතැන සඳහා අවශ්‍ය උපකරණ සෑදීමට ද පුරුදු පුහුණු කළහ.
* මුද්‍රණ යන්ත්‍ර නොමැති කාලයක තාපසයන් විසින් පොත් පිටපත් කිරීම සිදු කරන ලදී.

6. ii **දේශය ගොඩනැගීමෙහිලා ආගමික අධ්‍යාපනයෙහි භූමිකාව යන මැයෙන් රචනයක් ලියන්න.**

* අධ්‍යාපනය යනු යමෙකු වෘත්තියක් සඳහා පුරුදු පුහුණු කරවීමට සහ ලිවීමට කියවීමට ඉගැන්වීමට පමණක් නොවේ අධ්‍යාපනයෙහි ශුද්ද පරමාර්ථය පූර්ණ මිනිසෙකු තැනීමය. මේ සඳහා යම් යම් විෂයන් ඉගැන්වීමෙන් ඔබ්බට යා යුතු ය.
* මන් ද යම් යම් විෂයන් පමණක් ඉගැනීම කෙනෙකුගේ යහපතට මෙන්ම අයපතටද හැරිය හැකිය. තමා ඉගෙන ගන්නා දෙයින් තමා දියුණු වී සමාජයටත් යහපතක් කිරීම මෙන් ම සමාජයේ විනාශයට ද යොදා ගත හැකි ය.
* මේ නිසා විෂය දැනුමෙන් එහා යන තවත් දේ කෙනෙකුට අවශ්‍ය වේ. සදාචාරය සමාජ ජීවිතය ආදිය ගැන දැනුම ලබා දීමෙන් යහපත් මනුෂයෙකු සෑදීමට යම් සේවාවක් සිදු කළ හැකිය.
* එහෙත් අපට අමතක නොකල හැක්ක නම් මනුෂයා දැනුමෙන් තොර පුද්ගලයෙකු මෙන්ම යහපත් පුද්ගලයෙකු පමණක් නොවන බවය. මනුෂ්‍ය ජීවිතයට වඩා එහාට විහිදෙන්නකි. ඒ සඳහා ආගමික අධ්‍යාපනයක් අවශ්‍යය.
* කෙනෙකුට ජීවිතයේ සැබෑ පරමාර්ථය අන් අය කෙරෙහි දායාව, කැපවීම, සේවය කිරීම ආදිය කියා දෙන්නේ ආගම මගනි. එහෙත් දැනුම ලබා දීමේදී කෙනෙකුගේ බුද්ධිය ප්‍රයෝජනවත් වන අතර එක් එක් ආගම්වල ඇති සාරධර්ම ජීවිතයේ අරුත එය ලගා කර ගන්නා ආකාරය ආදිය ගැන පහදා දීම තුළින් ඔහු තුල අධ්‍යාපනික ප්‍රබෝධයක් ඇති වේ.
* පූර්ණ මනුෂ්‍යයෙකු බිහි කරන්නේ මෙලෙස බුද්ධිය සහ අධ්‍යාත්මය යන අංශ දෙකම එක්ව වර්ධනය වීමෙනි.
* විශේෂයෙන්ම ආගමික අධ්‍යාපනයක් ලැබීම මගින් කෙනෙකු තුළ අන් කෙරෙහි ප්‍රේමයක් ඇති වීම සහ තමා විසින් කළ යුතු යම් කාර්යයක් තිබෙන බව වටහා ගැනීම තුළ එම පුද්ගලයා තමා වසන දේශයට සහ ජනතාවටද සේවය කිරීමට හා ඔවුන් සමග සාමයෙන් සහ සමගියෙන් කටයුතු කිරීමේ ඇති වැදගත්කම සහ අවශ්‍යතාවයන් ද ඉස්මතු වේ.

7. I **බටහිර සභාව (Western Church) ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව තෝමස් මුන්ස්ටර්තුමා දැරූ ප්‍රධාන අදහස් පැහැදිලි කරන්න.**

* මුන්ට්සර් ළමා බෞතිස්මය ප්‍රතික්ෂේප කළේය.
* ඔහුගේ ප්‍රතිපත්තිය අනුගමනය කළ අය "ඇනබැප්තිස්ත" යැයි හඳුන්වනු ලැබීය.
* "ජර්මන් වන්දනාව" යන ජර්මන් සභාවට අදාළ වන්දනා ග්‍රන්ථය ලියා ප්‍රකාශ කළේය.
* දේවස්ථානවල ප්‍රතිමා පින්තූර විනාශ කරන ලදී.

* "Prague manifesto" ග්‍රන්ථය ජර්මන් ලතින් භාෂාවලින් ප්‍රකාශයට පත් කළේය.
* මරිය තුමිය ක්‍රිස්තුස් වහන්සේගේ උපතට පෙරද උපතේදීද උපතට පසුද කන්‍යාවක්ව සිටින ලද බවට වාද කළේ ය.
* කන්‍යා මරිය තුමිය තම බැහැපත් ජීවිතය තුළින් සාතන්ට විරුද්ධ සටනින් ජයග්‍රහණය ලබා අඳුර හා ආලෝකයත් දෙවියන් වහන්සේ හා මිනිසාත් අතර මැදිහත් කාරිනිය ලෙසත් දේශනා කළේ ය.

**7. ii නූතන ශ්‍රී ලංකීය සන්දර්භය තුළ සභා නවෝදයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.**

* ජේසුස් වහන්සේ මෙලොවට පැමිණියේ දේව රාජ්‍ය පිළිබඳ සුභාරංචිය දේශනා කිරීමටය. යමක් සුභාරංචියක් වන්නේ එය ජීවිතයට ඇති සම්බන්ධතාවය අනුවය. ප්‍රසිද්ධ ජීවිතයේ ආරම්භයත් සමග තම ග්‍රාමයට වැඩම කරන ජේසුස් වහන්සේ යෙසායා දිවැසිවරයාගේ පොතෙන් මෙසියස් තුමා සම්බන්ධ පාඨය ප්‍රකාශ කරයි.

"සමිදාණන්වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශණා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක, වහලුන්ට මිදීමද අන්ධයන්ට පෙනීමද ලැබෙන බව දන්වන්නටත් සමිදාණන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක."

* සැබවින්ම ක්‍රිස්තුස් වහන්සේ කටිනා ප්‍රකාශ කළ දේ ජීවිතය පුරා ඔප්පු කළ සේක.
* සුභාරංචිය යනු එක් කාලයකට හෝ එක් ප්‍රදේශයකට සීමා වූවක් නොවේ. එය සැම කලටම සියල්ලන්ටම පොදු වූ පණිවිඩයකි.
* සභාව වසර දෙදහස් තිස්සේ එම එකිනෙක කාලයට උචිත සේ හැඩ ගැසෙමින් සියල්ලන්ට ගැළපෙන පණිවිඩයක් බවට පත් වී ඇත.
* සුභාරංචි පණිවිඩය ජීවමාන පණිවිඩයක් වී ඇත්තේ සියලු ජනතාවට යොග්‍ය ලෙස ඔවුන්ගේ ගැළවීමට සුදුසු ලෙස එය හැඩ ගසා ගැනීමට හැකි වී ඇති හෙයිනි.
* වත්මන් ශ්‍රී ලාංකේය සමාජය ගත් කල ජනතාව බොහෝ සේ පීඩාවට පත් වූ අසාධාරණය හා අයුක්තියට වහල් වී ජීවත් වීමට සිදුව ඇති කාලයකි. එහෙයින් රටේ ජනතාවගේ විමුක්තිය සඳහා ක්‍රියා කිරීමට සභාවට විශාල ණයයුක්තියක් ඇත.පළමුවෙන් කළ යුත්තේ සභා නායකයන්ගේ ජීවිත වෙනස් කර කර ගැනීමය. පූජක ජීවිතයේ අරමුණ ලෞකික සැප සම්පත් සෙවීම හෝ මෙලොව සුබෝපභොගී ජීවිතයක් ගත කිරීමෙන් හෝ නොව ක්‍රිස්තුස් වහන්සේ මෙන් ජනතාවගේ සුභ සිද්ධිය සඳහා ක්‍රියාකිරීමය. ඒ වෙනුවෙන් කැපවීමය.
* ජන වන්දනාව ගත් කළ එය දෙවන වතිකානු මන්ත්‍රන සභාවෙන් යෝජනා කලාක් මෙන් දේශාණුරූපි විය යුතුය.
* ක්‍රිස්තුස් වහන්සේ සියල්ලන්ගේ ගැලවුම් කරුවා බව පෙනී යාමත් දේශීය සභාව දේශීය සිරිත් විරිත් වන්දනා ක්‍රම අනුගමනය කරන සභාවක් වුවහොත් පමණි.
* ශ්‍රී ලංකීය කතෝලික සභාව පැවත එන්නේ වඩ වඩාත් බටහිර ක්‍රමයට හැරී යාමක් ඇතුළාන්ත නවෝදයකට වඩා බාහිර ආටෝපයට මුල්තැන දෙමින් ක්‍රියාකිරීම දක්නට

ලැබේ. ජන වන්දනාවේ භාවිතා කරන ඇඳුම් පැලඳුම් පවා දේශීයභාවයට පිටුපා යෑමක් දැකිය හැකි ය.

* ජනතාව පීඩා විඳීමෙන් ගලවා ගැනීමට මේ යුගය තුළ දී කැපවීම ඉතා අවශ්‍ය සාධකයක්ව තිබේ. රට විනාශය කරා ගෙන යන පාලකයන්ගේ සහ ධනවතුන්ගේ පැත්ත ගැනීමට වඩා අසාධාරණයට ලක්ව සිටින පුරවැසියන්ගේ පැත්ත ගැනීම සභාවේ වගකීමයි.
* ක්‍රිස්තුස් වහන්සේගේ සභාව සමාජය තුළ ව්‍යුහගත වීමට නම් පූජක පැවිදි වූවන් විසින් ගිහි ජනතාවගේ සේවය නිසියාකාරව ලබා ගැනීමට සූදානම් වීමත් ගිහියන් ඔවුන්ගේ කාර්යයන් කිසිදු ලාබයක් බලාපොරොත්තු නොවී සිදු කිරීමටත් ඇප කැපව සිටිය යුතු ය.

**8. i පරිසරය සුරැකීම පිළිබඳව ආසියානු ක්‍රිස්තියානු සම්මේලනයේ ඉගැන්වීම් මොනවාදැයි පැහැදිලි කරන්න.**

* පරිසරය විනාශ වී යාම ස්වාභාවික ආපදාවලට ලක් වීම එය පාදක කොට ගෙන බහුජාතික සමාගම් විසින් ජනතාව සූරාකෑම ආදිය වැඩිපුර දක්නට ඇතත් ආසියාතික රටවල්වල්ද අප්‍රිකා සහ ලතින් ඇමරිකා රටවල් ද මෙම තත්ත්වයට මුහුණ දුන්නත්, ආසියාතික රටවල ඉහත කී තත්ත්වය ඉතා භයානක මට්ටමක පවතී. මේ නිසාම 2013 වසරේ ඉන්දුනීසියාවේදී රැස් වූ ආසියානු කිතුන් සභා සම්මේලනය පරිසරට සුරැකීම සඳහා නීති මාලාවක් සකස් කරන ලදී.
* සුනාමි, උෂ්ණත්වය වැඩිවීම් පිළිවෙලකින් තොරව සිදුවන වර්ෂාපතනය ආදිය නිසා මහත් ආර්ථික ගැටලුවලට මුහුණ දෙන ජනතාවගේ අසරණ තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් බහුජාතික සමාගම් ආදිය මගින් දුගී ජනතාවගේ ශ්‍රමය සූරාකෑම සිදු වෙමින් පවතී.

- සභාව මගින් පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.
- ඔවුන් දැනුවත් කරන පාඨමාලා ඇති කිරීම.
- ඔවුන් දැනුවත් කිරීමේ පත්‍රිකා ඇති කිරීම.
- පරිසරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම පමණක් නොසෑහේ. එය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.
- සභාවේ ඉගැන්වීම් ප්‍රායෝගික හා කලානුරූපී විය යුතු ය. (මැවීමේ දී දෙවියන් වහන්සේ පරිසරය ආරක්ෂා කිරීමට හා වැඩි දියුණු කිරීමට මිනිසාට භාර දුන් සේක)
- කැලෑ එළි කිරීම, ජලය දූෂණය වන ක්‍රියාමාර්ග නතර කිරීම, පොළව යට ගොඩනගන විදුලි බලාගාර ආදියෙන් සිදු වන පාරිසරික විනාශයන් නතර කිරීමට ක්‍රියාකිරීමය.
- ආසියාවේ ආර්ථික සංවර්ධනයන් අඩාල කරන බහුජාතික සමාගම් මගින් බහුල ලෙෂ මුදල් යෙදවීම නතර කිරීමට පියවර ගැනීම.
- දේශීය සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වීම.
- පරිසර නීතිය ස්ථාපනය කිරීම මගින් මැවීම සුරැකීමට කිතුනු දායකත්වය ලබා දීම.

**8. ii පරිසරය සුරැකීම සැමගේ යුතුකමකි. ඔබ වසන වටපිටාව තුළ පරිසරය සුරැකීම අරභයා ඔබට දායක විය හැකි අන්දම පැහැදිලි කරන්න.**

* දෙවියන් වහන්සේ ලෝකය මවා එය වැඩි දියුණු කර පූර්ණත්වයට පත් කිරීමත් එය ආරක්ෂා කිරීමේ වගකීමත් මනුෂයාට දෙවා වදාළ සේක. එසේ කළේ සීමිත පිරිසකට නොව මුළු මිනිස් වර්ගයාටය. ඒ නිසාම පරිසරය ආරක්ෂා කිරීම සහ පූර්ණත්වයට පත් කිරීම අප සියල්ලන්ගේ වගකීමකි.

* පරිසරය සුරැකීමෙන් තොරව මනුෂ්‍යයාට ජීවත් විය නොහැකිය. අප ජීවිතය රදා පවතින ප්‍රාණ වායුව පවා අප ලබා ගන්නේ අප වසන ලෝකයෙනි. ගස්වැල්වලින් නික්මෙන වායුවෙනි. මේ නිසා පරිසරය ආරක්ෂා කිරීම අප එකිනෙකාගේ ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ අපට ඇති වගකීමේ කොටසකි.

පරිසරය ආරක්ෂා කිරීමට අපට කළ හැකි කාර්යයන් කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- ගස්වැල් ආරක්ෂා හා හැකි සෑම විටම ගසක් සිටුවීමට පෙළඹීම.
- ජලයේ අපතේ නොහැරීම, ජලය අපිරිසිදු නොකිරීම.
- පරිසරය පුරා කුණු නොදැමීම (තැන්තැන්වල කුණු දැමීම මගින් පරිසරය අපවිත්‍ර වීම, මැසි මදුරුවන් හා කෘමි සතුන් බෝ වීම නිසා ලෙඩ රෝග ඇති වීම)
- නොදිරන ද්‍රව්‍යයන් තැනින් තැන නොදැමීම.
- එදිනෙදා ජීවිතයේ දී පරිභෝජනයට හැකි සෑමවිටම දිරායන කඩදාසි කාඩ්බෝඩ් ආදිය භාවිත කිරීම.
- රසායනික පොහොර වෙනුවට කොම්පෝස්ට් පොහොර භාවිත කිරීම.